# 2019 පළමු මාස හයේ කාර්මික අපනයන ආදායම සියයට 6.7%කින් වර්ධනය වෙයි

**බද්දේගම - ඕ. කමලනාථ**

2019 වසරේ පළමු මාස හයේදී කාර්මික අපනයන ආදායම ඇමෙරිකන් ඩොලර් මිලියන 4,728.6ක් වී ඇතැයි ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික හා පර්යේෂණ දෙපාර්තමේන්තුව 21දා නිකුත් කළ නිවේදනයක දැක්වේ. 2018 වසරේ පළමු මාස 06යේ එම ආදායම ඇමෙරිකන් ඩොලර් මිලියන 4,433.7ක් විය. ඒ අනුව 2018 පළමු මාස 06ට සාපේක්ෂව 2019 පළමු මාස හයේදී කාර්මික අපනයන ආදායම සියයට 6.7%කින් හෙවත් ඇමෙරිකන් ඩොලර් මිලියන 294.9කින් ඉහළ ගොස් ඇත.

කාර්මික අපනයන යටතේ ගැනෙන සත්ත්ව ආහාර 30.6%කින්ද, රෙදිපිළි සහ ඇඟලුම් 9.6%කින්ද, එයින් ඇඟලුම් 9.4%කින්ද, රෙදිපිළි 14.4%කින්ද, වෙනත් රෙදිපිළි සැකසුම් 10.8% කින්ද රබර් නිෂ්පාදන 3.7%කින්ද, ප්‍රවාහන උපකරණ 110.3%කින්ද, රසායනික නිෂ්පාදන 7.5%කින්ද, මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන 128.8%කින්ද, මූල ලෝහ හා උපාංග 17.7%කින්ද, කැපී පෙනෙන වර්ධනයක් අත් කරගෙන ඇත.